මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා අතර මුළින්ම තීන්දු දෙනු ලබනුයේ අල්ලාහ්ගේ මාර්ගයේ දිවි පිදූ මිනිසාටය. ඔහු කැඳවා ගෙන එනු ලැබ, ඔහුට හිමි ආශිර්වාදයන් ඔහුට දන්වා සිටියි. එවිට ඔහු එය හඳුනා ගනී. මෙහි කුමක් සිදු කළෙහිද යැයි විමසයි. එවිට ඔහු: මම දිවි පුදන තෙක් ඔබ වෙනුවෙන් සටන් කළෙමි යැයි පවසයි.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කළ ප්රකාශයකට තමන් සවන් දුන් බව
අබූ හුරය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. ((මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා අතර මුළින්ම තීන්දු දෙනු ලබනුයේ අල්ලාහ්ගේ මාර්ගයේ දිවි පිදූ මිනිසාටය. ඔහු කැඳවා ගෙන එනු ලැබ, ඔහුට හිමි ආශිර්වාදයන් ඔහුට දන්වා
සිටියි. එවිට ඔහු එය හඳුනා ගනී. මෙහි කුමක් සිදු කළෙහිද යැයි විමසයි. එවිට ඔහු: මම දිවි පුදන තෙක් ඔබ වෙනුවෙන් සටන් කළෙමි යැයි පවසයි. ඔහු: ඔබ බොරු කීවේහිය. ඔබ වීරයකු යැයි පවසනු ලබන්නට සටන් කළෙහිය. යැයි පවසයි. පසුව ඔහු සම්බන්ධයෙන් නියෝග කරනු ලැබ, නිරා ගින්නෙහි හෙළනු ලබන තෙක් මුණින් ඇදගෙන යනු ලැබේ. තවත් මිනිසෙකුට තීන්දු දෙනු ලැබේ. ඔහු දැනුම හදාරා එය අන් අයට උගන්වා අල් කුර්ආනය කියවා ඇත. ඔහුව ගෙන එනු ලැබ ඔහු සතු ආශිර්වාදයන් ඔහුට හඳුන්වා දෙයි. එය ඔහු හඳුනා ගනී. මේ සම්බන්ධයෙන් ඔබ කටයුතු කළේ කෙසේද? යැයි විමසයි. මම දැනුම ලබා එය අන් අයට ඉගැන්වූයෙමි. ඔබ වෙනුවෙන් අල් කුර්ආනය කියවූවෙමි යැයි පවසයි. ඔබ බොරු පවසන්නෙහිය. ඔබ විද්වතෙකු යැයි පවසනු ලබන්නට ඔබ දැනුම හැදෑරුවෙහිය. හොඳ කාරි(අල් කුර්ආනය කියවීමට දක්ෂ) අයකු යැයි කියනු ලබන්නට ඔබ අල් කුර්ආනය කියෙව්වෙහිය. පසුව නිරයේ ගින්නට ඇද දමනු ලබන තෙක් ඔහුගේ මුණින් ඇදගෙන යන මෙන් නියෝග කරනු ලැබේ. තවත් මිනිසෙකුට (තීන්දු දෙනු ලැබේ) අල්ලාහ් ඔහුට මූල්ය වශයෙන් විස්තීරණය කර තිබිණ. ධනයෙන් ඇතැම් කොටස් ඔහු පිරිනැමීය. ඔහු ගෙන එනු ලැබ ඔහුගේ ආශිර්වාදය ඔහුට හඳුන්වා දෙයි. ඔහු එය හඳුනා ගනී. මේ සම්බන්ධයෙන් ඔබ කුමක් සිදු කළේ දැයි විමසයි. වියදම්
කරනු ලබන්නට ඔබ ප්රිය කරන මාර්ග ඔස්සේ වියදම් කිරීම මා අතහැර දැමුවේ නැත. එය ඔබ වෙනුවෙන්ම වියදම් කළෙමි යැයි පවසයි. ඔබ බොරු පවසන්නෙහිය. නමුත් ඔබ එසේ සිදු කළේ ධානපතියෙකු යැයි කියනු ලැබීමටය. පසුව නිරයේ ගින්නට හෙළනු ලබන තෙක් ඔහුගේ මුණින් ඇදගෙන යනු ලබන මෙන් නියෝග කරනු ලැබේ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

හදීසයේ අර්ථය: මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා අතුරින් පළමුව තීන්දු දෙනු ලබනුයේ කණ්ඩායම් තුනකටය: මූණිච්චාවට ඉගැන්වූ අය, මූණිච්චාවට සටන් කළ අය හා මූණිච්චාවට දන් දුන් අය වෙති. පසුව අල්ලාහ් එදින ඔවුන් කැඳවා ඔවුනට හිමි ආශිර්වාදයන් පිළිබඳ දන්වා සිටියි. ඔවුහු එය හඳුනා ගෙන ඒවා පිළිගනිති. ඔවුන් සෑම කෙනෙකුගෙන්ම ප්රශ්න කරනු ලැබේ. ඔබ කුමක් සිදු කළෙහි ද එනම් මෙම ආශිර්වාදයන්ට කෘතගුණ සැලකනු වස් කුමක් සිදු කළෙහිද යැයි

ප්රශ්න කරයි. එවිට පළමුවැන්නා: මම දැනුම හැදෑරුවෙමි ඔබ විෂයයෙහි අල් කුර්ආනය කියෙව්වෙමි යැයි පවසයි. එවිට අල්ලාහ්: ඔබ බොරු පැවසුවෙහිය. නමුත් ඔබ විද්වතෙකු යැයි හඳුන්වාගනු පිණිස දැනුම හැදෑරුවෙහිය ඔබ කාරි වරයකු යැයි හඳුන්වාගනු පිණිස අල් කුර්ආනය කියෙව්වෙහිය. එය අල්ලාහ් වෙනුවෙන් නොව මූණිච්චාව හේතුවෙනි යැයි පවසනු ලැබේ. පසුව ඔහුට නියෝග කරයි. නිරයේ ගින්නට මුණින් ඇදගෙන ගොස් හෙළනු ලැබේ. මොහුට පසු පවසනු ලැබූ උදවියගේ තත්ත්වයද එලෙසමය.

https://sunnah.global/hadeeth/si/show/8899